259006

OL/2025(2026)/11/S-I, II

සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

| 11 | S | I, II |
|---|---|---|

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
# கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
# General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

බුද්ධ ධර්මය I, II
பௌத்தம் I, II
Buddhism I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## බුද්ධ ධර්මය I

*උපදෙස්:*

※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

※ අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

※ **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**

※ එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** සිදුහත් බෝසතාණන් මුහුණදුන් අභියෝග අතර අතිශය දුෂ්කරම අභියෝගය වූයේ,
(1) දස මරුන් පරාජයට පත් කිරීමයි.
(2) මාර දූවරුන්ගේ වසඟයට පත් නොවී සිටීමයි.
(3) රාජ්‍යය, අඹු දරුවන් අතහැර අභිනිෂ්ක්‍රමණය කිරීමයි.
(4) ලෞකික පෘථග්ජන ස්වභාවය ඉක්මවා ලෝකෝත්තර තත්ත්වයට ළඟාවීමයි.

**2.** සියලු යස ඉසුරු මැද දිවි ගෙවූ තරුණයකු වුවද විමසිලිමත් බව නිසාම ජීවිතයේ යථාර්ථය යනු තමා අත්විඳින ජීවිතය නොවන බව සිදුහත් කුමාරයාට අවබෝධ වූයේ,
(1) නිළියන්ගේ විප්‍රකාර දැකීමෙනි.
(2) යසෝදරා දේවියට පුතකු ලද බව ඇසීමෙනි.
(3) සතර පෙර නිමිති දැකීමෙනි.
(4) රම්‍ය, සුරම්‍ය, සුභ යන මාලිගා තුනක විසීමෙනි.

**3.** බුදුරජාණන් වහන්සේ තමා අවබෝධ කරගත් ධර්මය අන්‍යයන්ට දේශනා කිරීමට සැරසුණු මොහොතේ මුහුණදුන් ප්‍රමුඛතම අභියෝගය වූයේ,
(1) ආලාරකාලාම තවුසා අරූපී බඹලොව ඉපදී සිටීමයි.
(2) පස්වග තවුසන් තම බුද්ධත්වය පිළිගැනීමට මැලිවීමයි.
(3) පෘථග්ජන මිනිස් සමාජයට ගැඹුරු දහම අවබෝධ කරවීමයි.
(4) දෙව් බඹුන් විශාල පිරිසක් දහම් ඇසීමට පැමිණීමයි.

**4.** සංඝ රත්නයේ ගුණ නිවැරදිව ප්‍රකාශ වන වරණය කුමක් ද?
(1) ඕපනයිකෝ, ආහුණෙය්‍යෝ, පාහුණෙය්‍යෝ, දක්ඛිණෙය්‍යෝ
(2) ආහුණෙය්‍යෝ, පාහුණෙය්‍යෝ, දක්ඛිණෙය්‍යෝ, අකාලිකෝ
(3) ආහුණෙය්‍යෝ, පාහුණෙය්‍යෝ, දක්ඛිණෙය්‍යෝ, අඤ්ජලිකරණීයෝ
(4) ආහුණෙය්‍යෝ, පාහුණෙය්‍යෝ, අඤ්ජලිකරණීයෝ, සන්දිට්ඨිකෝ

**5.** සංසාර සාගරය තරණය කිරීමට වෙහෙස වන බෞද්ධයකු සතුව තිබිය යුතු මූලික ගුණාංගය හඳුන්වන්නේ කවර නමකින් ද?
(1) භක්තිය (2) බුද්ධිය (3) වීර්යය (4) ශ්‍රද්ධාව

**6.** සම්මා වායාම යනු යහපත් උත්සාහයයි. එහි සිව් වැදෑරුම් අංගයන්ට අයත් **නොවන** කරුණ වන්නේ,
(1) නූපන් කුසල් ඉපදවීම යන්නයි. (2) නූපන් අකුසල් ඉපදවීම යන්නයි.
(3) උපන් කුසල් වැඩිදියුණු කිරීම යන්නයි. (4) නූපන් අකුසල් නූපදවීම යන්නයි.

[දෙවැනි පිටුව බලන්න.

**7.** හැකියාව තිබියදීත් මහලු වියට පත් මව්පියන්ට නොසැලකීම, ස්ත්‍රී සුරා දූ කෙළියෙහි ලොල්ව ලත් ධනය විනාශ කිරීම, පුද්ගල ජීවිතයේ අසාර්ථකත්වයට හේතුවන බව දේශනා කරනු ලැබූ සූත්‍රය කුමක් ද?
(1) වසල සූත්‍රය (2) පරාභව සූත්‍රය
(3) මංගල සූත්‍රය (4) සිගාලෝවාද සූත්‍රය

**8.** චක්ෂුරාදී ඉන්ද්‍රියයන් මගින් රූපාදී අරමුණු දැන ගැනීම ධර්මයෙහි හඳුන්වන්නේ,
(1) ඤාණය නමිනි. (2) චේතනාව නමිනි.
(3) පරිදේව නමිනි. (4) විඤ්ඤාණ නමිනි.

**9.** රූප ශබ්දාදී වශයෙන් සිත් තුළ උපදින නිමිති සටහන් ආදිය ධර්මයෙහි හැඳින්වෙන්නේ,
(1) රූප ස්කන්ධය නමිනි. (2) වේදනා ස්කන්ධය නමිනි.
(3) සඤ්ඤා ස්කන්ධය නමිනි. (4) සංඛාර ස්කන්ධය නමිනි.

**10.** 'මෙය ඇති කල මෙය ඇත. මෙය නැති කල මෙය නැත' යන නියමය අනුව 'දර ඇති කල ගිනි ඇත. දර නැති කල ගිනි නැත' යන හේතුඵල සබඳතාව පැහැදිලි කළ සූත්‍ර දේශනාව කුමක් ද?
(1) දම්සක් පැවතුම් සූත්‍රය (2) අග්ගික භාරද්වාජ සූත්‍රය
(3) අග්ගික්ඛන්ධෝපම සූත්‍රය (4) අග්ගිවච්ඡගොත්ත සූත්‍රය

**11.** අනුලෝම පටිච්ච සමුප්පාද න්‍යායෙහි 'ස්පර්ශය හේතු කොටගෙන සුඛ දුක්ඛ ආදී වේදනා පහළ වේ' යන්න ප්‍රකාශ වන්නේ,
(1) "සළායතනපච්චයා ඵස්සෝ" යන්නෙනි. (2) "ඵස්සපච්චයා වේදනා" යන්නෙනි.
(3) "වේදනාපච්චයා තණ්හා" යන්නෙනි. (4) "තණ්හාපච්චයා උපාදානං" යන්නෙනි.

**12.** පටිච්ච සමුප්පාද න්‍යාය අනුව තණ්හාව මුල්කොට ගෙන සමාජයේ කලකෝලාහල ආදිය ඇතිවන ආකාරය පෙන්වා දෙන සූත්‍ර දේශනාව වන්නේ,
(1) අග්ගඤ්ඤ සූත්‍රයයි. (2) වාසෙට්ඨ සූත්‍රයයි.
(3) බ්‍රහ්මජාල සූත්‍රයයි. (4) මහානිදාන සූත්‍රයයි.

**13.** දැඩි චේතනාවක් නොමැතිව සිදුවන අසම්පූර්ණ කුසලාකුසල කර්ම ධර්මයේ හඳුන්වන්නේ කවර නමකින් ද?
(1) ගරුක කර්ම (2) ආසන්න කර්ම
(3) ආචිණ්ණ කර්ම (4) කටත්තා කර්ම

**14.** පුද්ගලයා සිදු කරන කුසලාකුසල කර්මවලට අනුරූපීව ලබන ස්කන්ධ පටිපාටිය අනුව නැවත නැවතත් ඉපදෙමින් මිය යාම ධර්මයේ හඳුන්වන්නේ,
(1) සංසාරය නමිනි. (2) උපත නමිනි.
(3) චුතිය නමිනි. (4) නියාමය නමිනි.

**15.** සර්වබලධාරී මැවුම්කාර දෙවියකු ඇත, නිත්‍ය ආත්මයක් ඇත යන සංකල්පයන් බැහැරලීමට ඉවහල්වන බෞද්ධ ඉගැන්වීම වන්නේ,
(1) පටිච්ච සමුප්පාදයයි. (2) ත්‍රිවිද්‍යාවයි.
(3) සතර ඍද්ධිපාදයයි. (4) අටලෝ දහමයි.

**16.** බෞද්ධ විග්‍රහයට අනුව අල්පායුෂ වීම, දීර්ඝායුෂ වීම ආදී පුද්ගල විෂමතා සඳහා බලපාන හේතු පිළිබඳ මනා අවබෝධයෙන් යුත් තැනැත්තා,
(1) පරලොව පිළිබඳවම සිතන්නෙකි.
(2) ජය පරාජය ගැන සිතන්නෙකි.
(3) මෙලොව පිළිබඳවම සිතන්නෙකි.
(4) කර්ම, කර්ම විපාක පිළිබඳ අවබෝධය ඇත්තෙකි.

**17.** චුතූපපාත ඤාණය හෙවත් සත්ත්වයන්ගේ මතු පැවැත්ම දක්නා නුවණ ඇති අයෙකුට,
(1) අන් අයගේ සිත් ගැන දැනගත හැකි ය.
(2) පුනර්භවය අත්දැකීමෙන් දත හැකි ය.
(3) විවිධ ඍද්ධි ප්‍රාතිහාර්ය පෑ හැකි ය.
(4) දිව්‍යමය ශබ්ද ශ්‍රවණය කළ හැකි ය.

**18.** සිත සංවර කරගැනීමට බාධාකාරී වන සහ නිවන් මග අහුරාලන කරුණු පහක් ධර්මයේ දැක්වේ. එය,
(1) පංච බල නම් වේ. (2) පංච නීවරණ නම් වේ.
(3) පංච නියාම නම් වේ. (4) පංච උපාදාන නම් වේ.

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

19. “අසවලා මට බැන්නේ ය. මට පහර දුන්නේ ය. මා පැරදු වූයේ ය.” යනාදි වශයෙන් වෛර නොබඳින්නාගේ වෛරය සන්සිඳෙන බව අවධාරණය කරමින් දේශනා කළ ධම්මපද ගාථාවේ මුල් දෙපදය වන්නේ,
(1) “අක්කොච්ඡි මං අවධි මං - අජිනි මං අහාසි මේ” යන්නයි.
(2) “සුකරානි අසාධූනි - අත්තනො අහිතානි ච” යන්නයි.
(3) “අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති” යන්නයි.
(4) “තං ච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පති” යන්නයි.

20. බුදුරජාණන් වහන්සේ ජීවමාන සමයෙහි පාපමිත්‍ර සේවනය හා සීලයෙහි නොපිහිටා කටයුතු කිරීම නිසා උපයාගත් සියලු ධනය වියදම් කොට දිළින්දකු බවට පත් වූ පුද්ගලයා කවුද?
(1) උග්ග සිටු පුත්‍රයා (2) කාල සිටු පුත්‍රයා
(3) මහධන සිටු පුත්‍රයා (4) මිගාර සිටු පුත්‍රයා

21. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන භෝග විනාශයට හේතුවන කරුණු අතරට අයත් **නොවන** කරුණ වන්නේ,
(1) නොකල්හි වීථි සංචාරය කිරීමයි. (2) පවිටු මිතුරන් ඇසුරු කිරීමයි.
(3) නිතර නිදන සුලු වීමයි. (4) අලසකමින් කල් ගෙවීමයි.

22. “දරුව, මෙම සක්විති රජකම ඔබට පිය උරුමයෙන් හිමිවන්නෙක් නොවේ. ඒ සඳහා නිසි පිළිවෙත් පුරා සුදුස්සෙකු විය යුතු ය.” තම පුතුට මෙලෙස අවවාද ලබා දුන්නේ,
(1) බිම්බිසාර රජතුමා ය. (2) බින්දුසාර රජතුමා ය.
(3) උදේනි රජතුමා ය. (4) දළ්හනේමි රජතුමා ය.

23. “සිල්වත්, ගුණවත්, වියත් මහණ බමුණන්ගෙන් අවවාද අනුශාසනා ලබාගනිමින් රට පාලනය කරන්න.” මෙම උපදෙස ඇතුළත් බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්තිය වන්නේ,
(1) දස රාජධර්මයි. (2) සප්ත අපරිහානිය ධර්මයි.
(3) දස සක්විතිවත් ය. (4) සිව් සඟරාවත් ය.

24. “නීතියට, යුක්තියට, ධර්මයට පටහැනිව ක්‍රියා කිරීමෙන් පාලකයකුගේ යසස අව පක්ෂයේ සඳ මෙන් පරිහානියට පත් වේ.” මේ සඳහා බලපාන්නේ,
(1) සතර අගතියෙන් යුක්තව කටයුතු කිරීමයි.
(2) සිව් සඟරාවත්වලින් යුක්තව කටයුතු කිරීමයි.
(3) සිව් බඹ විහරණවලින් යුක්තව කටයුතු කිරීමයි.
(4) සතර කර්ම ක්ලේශයන්ගෙන් යුක්තව කටයුතු කිරීමයි.

25. බුදුරජාණන් වහන්සේ සමග සමීප සබඳතා පවත්වමින් රාජ්‍ය පාලනය ගෙන ගිය රාජාණ්ඩු පාලකයා හා රාජ්‍යය නිවැරදිව දැක්වෙන වරණය කුමක් ද?
(1) බිම්බිසාර රජු - කෝසල රාජ්‍යය (2) කොසොල් රජු - වත්ස රාජ්‍යය
(3) උදේන රජු - මගධ රාජ්‍යය (4) චණ්ඩපජ්ජෝත රජු - අවන්ති රාජ්‍යය

26. ලෝකයේ ආගම් පිළිබඳ ඉතිහාසයේ කිසිදු තැනෙක දක්නට නොලැබෙන පෙර'පර දෙදිග විද්වතුන්ගේ අවධානයටත් පැසසුමටත් භාජනය වූ බුදුසමයාගත චින්තන නිදහස විවරණය කෙරෙන දේශනාව කුමක් ද?
(1) අනණ සූත්‍රය (2) වසල සූත්‍රය (3) පත්තකම්ම සූත්‍රය (4) කාලාම සූත්‍රය

27. මංගල සූත්‍රයේ සඳහන් මගුල් කරුණු අතරට අයත් **නොවන** කරුණ වන්නේ,
(1) බාලයන් ඇසුරු කිරීම යන්නයි. (2) නුවණැත්තන් ඇසුරු කිරීම යන්නයි.
(3) පිදියයුත්තන් පිදීම යන්නයි. (4) සුදුසු ප්‍රදේශයක වාසය කිරීම යන්නයි.

28. බුදුරජාණන් වහන්සේ විසින් ගිරිමානන්ද තෙරුන්ට දේශනා කළ රෝග වැළඳීමට හේතු වන කරුණුවලට අයත් **නොවන** කරුණ කුමක් ද?
(1) පිත් ධාතුව කිපීමෙන් රෝග වැළඳේ යන්නයි
(2) සෙම් ධාතුව කිපීමෙන් රෝග වැළඳේ යන්නයි
(3) කර්ම විපාක අනුව රෝග වැළඳේ යන්නයි
(4) දුසිරිතෙහි යෙදීමෙන් රෝග වැළඳේ යන්නයි

29. බුදුරජාණන් වහන්සේ මහා මොග්ගල්ලාන සූත්‍රය දේශනා කළේ කුමන ස්ථානයේදී ද?
(1) විශාලා මහනුවර වන පියසකදී (2) ගග්ගරා පොකුණ සමීපයේදී
(3) කලන්දක නිවාප නම් ස්ථානයේදී (4) මහී ගංගා තීරය අසලදී

[හතරවැනි පිටුව බලන්න.

**30.** බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය සහ පණවන ලද විනය භික්ෂූන් වහන්සේලා එක්වී සජ්ඣායනා කිරීම හඳුන්වන්නේ,
(1) පොහොය කිරීම ලෙස ය. (2) ධර්ම දේශනා කිරීම ලෙස ය.
(3) පිරිත් දේශනා කිරීම ලෙස ය. (4) ධර්ම සංගායනා කිරීම ලෙස ය.

**31.** පළමු ධර්ම සංගායනාවේදී සූත්‍ර දේශනා සංග්‍රහ කොට සකස් කිරීමේදී සංඛ්‍යාත්මකව අංකයෙන් අංකයට වැඩි වන ලෙස දේශනා කළ සූත්‍ර එක්කොට සැකසූ ග්‍රන්ථය කවර නමකින් හැඳින්වේ ද?
(1) දීඝ නිකාය (2) මජ්ඣිම නිකාය
(3) අංගුත්තර නිකාය (4) සංයුත්ත නිකාය

**32.** "ආනන්ද මවිසින් දේශනා කරන ලද යම් ධර්ම විනය දෙකක් වේ ද, එය මාගේ ඇවෑමෙන් ශාස්තෘවරයා වන්නේ ය." බුදුරජාණන් වහන්සේ තම ජීවිතයේ අවසාන භාගයේදී දේශනා කළ මෙම ප්‍රකාශය ඇතුළත් වන්නේ,
(1) මහාපරිනිබ්බාන සූත්‍රයේ ය. (2) මහාසීහනාද සූත්‍රයේ ය.
(3) මහාසතිපට්ඨාන සූත්‍රයේ ය. (4) මහාසුදස්සන සූත්‍රයේ ය.

**33.** ත්‍රිපිටකයට 'විභාෂා' නමින් අටුවා ග්‍රන්ථ සම්පාදනය කොට එය තඹපත් ඉරුවල ලියවා සෙල්මුවා මංජුසාවල බහා තැන්පත් කොට ස්තූපයක් ගොඩනංවනු ලැබුයේ,
(1) කාලාශෝක රජතුමා විසිනි. (2) චන්ද්‍රගුප්ත රජතුමා විසිනි.
(3) ධර්මාශෝක රජතුමා විසිනි. (4) කණිෂ්ක රජතුමා විසිනි.

**34.** "ලංකාවේ රාජ්‍ය ආගම බුද්ධාගම විය යුතු ය. රජු බෞද්ධයකු විය යුතු ය.' යන සම්මතය ඇති වූයේ,
(1) අබෞද්ධ රජුන් රජවීම නිසා ය.
(2) විදේශීය ආක්‍රමණ ඇති වූ නිසා ය.
(3) බුදුදහම හා ජන සමාජය අතර සබැඳියාව ශක්තිමත් වූ නිසා ය.
(4) බුදුදහම යටපත් වී වෙනත් ආගම් මතු වූ නිසා ය.

**35.** මිහිඳු මහරහතන් වහන්සේ ලාංකිකයනට බුදුදහම හා බෞද්ධ සංස්කෘතිය හඳුන්වා දීමත් සමග ලාංකිකයන් තුළ ඇති වූ වෙනස ප්‍රකාශ **නොවන** වරණය කුමක් ද?
(1) වෘක්ෂ වන්දනාව වෙනුවට බෝධි වන්දනාවට යොමු විය.
(2) මළවුන් ඇදහීම වෙනුවට මළවුන්ට පින් අනුමෝදන් කිරීමට යොමු විය.
(3) ගල් පර්වතවලට වැඳුම් පිදුම් කිරීම වෙනුවට ස්තූප වන්දනාවට යොමු විය.
(4) දෙවියන්ට පිං දීම වෙනුවට පුද පූජා පැවැත්වීමට යොමු විය.

**36.** දඹදෙණි සාහිත්‍ය යුගයේදී පාලි ධම්මපදට්ඨකථාව සිංහලට පරිවර්තනය කිරීමෙන් රචනා වූ සාහිත්‍ය කෘතිය කුමක් ද?
(1) සිංහල බෝධිවංශය (2) සද්ධර්ම රත්නාවලිය
(3) පන්සිය පනස් ජාතක පොත් වහන්සේ (4) පූජාවලිය

**37.** "මා අනන්ත බුදුගුණ කියන්නට ගන්නා මෙම උත්සාහය නෙලුම් හුයකින් පිනිබිඳු අමුණා පැළඳීමට ගන්නා උත්සාහයක් වැනි ය." යන ප්‍රකාශය ඇතුළත් වන්නේ,
(1) පූජාවලියෙහි ය. (2) සසදාවතෙහි ය. (3) මුවදෙව්දාවතෙහි ය. (4) අමාවතුරෙහි ය.

**38.** විවිධ සංස්කෘතීන්ට අනුව හැඩගැසුණු ජාතීන් හා ආගමිකයින් වෙසෙන සමාජ වටපිටාවක, ඔවුන් සමග මතවාද ගැටුම් ඇති කර නොගෙන ජීවත්වීමට ඉවහල් වන ගුණධර්ම සමූහය ධර්මයෙහි හැඳින්වෙන්නේ,
(1) පංච ශීලය නමිනි. (2) සතර අගතියෙන් තොරවීම නමිනි.
(3) සප්ත අපරිහානිය ධර්ම නමිනි. (4) සතර බ්‍රහ්ම විහරණ නමිනි.

**39.** බෞද්ධ සිතුවම් කලාවේ ආරම්භය අනුරාධපුර යුගය දක්වා විහිදෙන අතර, අනුරාධපුර යුගයට අයත් ඉපැරණි සිතුවම් හමුවන ස්ථාන දෙකක් දැක්වෙන වරණය කුමක් ද?
(1) මහියංගනය, දිඹුලාගල (2) සීගිරිය, හිඳගල
(3) මහියංගනය, තිවංක පිළිමගෙය (4) ගල්විහාරය, මැදවල විහාරය

**40.** බෞද්ධ කලා නිර්මාණ අතර සුවිශේෂී කලා කෘතියක් ලෙස සැලකෙන සඳකඩපහණ සම්බන්ධයෙන් **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) පියගැට පෙළක ආරම්භයේ දක්නට ලැබෙන අර්ධ කවාකාර ගල් පුවරුවකි.
(2) කලාත්මක අතින් අග්‍රගණ්‍ය සඳකඩපහණ අනුරාධපුරයේ බිසෝ මාලිගය අසල පිහිටා ඇත.
(3) අනුරාධපුර යුගයේ සඳකඩපහණින් ගව රූපය ඉවත් කොට ඇත.
(4) සඳකඩපහණ තුළින් භව චක්‍රය නිරූපණය වන බව සෙනරත් පරණවිතාන පවසයි.

[පස්වැනි පිටුව බලන්න.

**

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

11 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

බුද්ධ ධර්මය I, II
பௌத்தம் I, II
Buddhism I, II

## බුද්ධ ධර්මය II

※ **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

※ පළමුවැනි ප්‍රශ්නයට ලකුණු **20** ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) බෝසතුන්ගේ අනුපමේය රූපශ්‍රිය දැක "මෙවන් පුතකු ලද මවක් පියෙක් නිවුණෝ වෙති" යනුවෙන් ප්‍රකාශ කරනු ලැබුවේ කවුරුන් විසින් ද?

(ii) රහසත් පව් නො කොට - කෙලෙසරයනුත් දුරුකොට ...
යනාදී පද්‍යයෙන් කියවෙන්නේ කිනම් බුදුගුණය ද?

(iii) ධර්ම රත්නයෙහි ගුණයක් වන 'ස්වාක්ඛාත' යන්නෙහි අර්ථය ලියන්න.

(iv) බොරැල්ල ගෝතමී විහාරයේ බිතු සිතුවම් අඳිනු ලැබූ ශිල්පියාගේ නම කුමක් ද?

(v) 'නිබ්බානං පරමං සුඛං' යන්නෙහි අදහස ලියන්න.

(vi) 'අනවජ්ජ සුඛය' පහදන්න.

(vii) "සමණාමයං මහාරාජ - ධම්මරාජස්ස සාවකා" යන්න කවුරුන් විසින් කා හට ප්‍රකාශ කරන ලද්දක් ද?

(viii) මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන හා පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන ආරම්භ කළ නාහිමිවරුන්ගේ නම් ලියන්න.

(ix) දුමින්දාගමනයෙන් ශ්‍රී ලාංකිකයින් ලැබූ දායාද **දෙකක්** සඳහන් කරන්න.

(x) තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් රචනා කරනු ලැබූ ග්‍රන්ථ **දෙකක** නම් ලියන්න.

**2.** (i) දස පාරමිතා අතුරෙන් **දෙකක්** නම් කරන්න.

(ii) ඉහත (i) හි නම් කළ **එක්** පාරමිතාවක් සැකෙවින් පැහැදිලි කරන්න.

(iii) දස පාරමිතාවල උගන්වන ගුණධර්ම පූරණය කිරීමෙන් පරාර්ථ සේවය සැලසෙන ආකාරය පැහැදිලි කරන්න.

**3.** (i) "අත්තනාව කතං පාපං" යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර ලියන්න.

(ii) එම ගාථාවේ තේරුම ලියන්න.

(iii) තමා විසින් සිදු කරනු ලබන ක්‍රියා පුද්ගලයාගේ දියුණුවට හා පරිහානියට ඉවහල් වන ආකාරය පෙන්වා දෙන්න.

**4.** (i) ස්තූප ගොඩනැංවීමේදී අදාළ කරගනු ලබන ආකෘති හයෙන් **දෙකක්** ලියා දක්වන්න.

(ii) ස්තූපාංග **දෙකක්** නම් කර **එකක්** පහදන්න.

(iii) මහින්දාගමනයේ ප්‍රතිඵල ලෙස ශ්‍රී ලාංකිකයන්ට උරුම වූ දායාද පිළිබඳ ඇගයීමක් කරන්න.

[හයවැනි පිටුව බලන්න.

**5.** (i) පළමු ධර්ම සංගායනාව පැවැත්වීම සඳහා හේතු වූ කරුණු අතුරෙන් **දෙකක්** ලියන්න.

(ii) එම සංගායනාව පැවැත් වූ ස්ථානය, සංගායනාව සඳහා ගත වූ කාලය සහ සහභාගි වූ රහතන් වහන්සේලා සංඛ්‍යාව සඳහන් කරන්න.

(iii) පළමු ධර්ම සංගායනාවේදී ගනු ලැබූ තීරණ සම්බුදු සසුනේ චිර පැවැත්මට ඉවහල් වූ ආකාරය පැහැදිලි කරන්න.

**6.** (i) "ජිගච්ඡා පරමා රෝගා" මෙහි අර්ථය පහදන්න.

(ii) භද්දාලි සූත්‍රයේ දැක්වෙන පරිදි ආහාරයෙහි පමණ දැන අනුභව කිරීම නිසා ලැබෙන යහපත් ප්‍රතිඵල **තුනක්** ලියන්න.

(iii) කායික හා මානසික නීරෝගීතාව රැකගැනීමේ වටිනාකම පිළිබඳ බුදුදහමේ දැක්වෙන කරුණු ඇගයීමට ලක් කරන්න.

**7.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකකට** කෙටි සටහන් ලියන්න.

(i) ව්‍යාපාද නීවරණය

(ii) ප්‍රතිමාඝර

(iii) අලුවිහාර සංගායනාව

(iv) මවුපිය දූදරු යුතුකම්

* * *


259006

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න


# 11 ශ්‍රේණිය කෙටි සටහන් පොත් සංශෝධිත නව විෂය නිර්දේශයේ පාඩමෙන් පාඩමට



Rs : 300




Rs : 300



Rs : 300




Rs : 300




Rs : 300




Rs : 300



Rs : 350




Rs : 300



Rs : 300




Rs : 200




Rs : 200




Rs : 200




Rs : 250




Rs : 250




Rs : 200




Rs : 200




Rs : 200




Rs : 300




Rs : 300



Rs : 200



Rs : 200



Rs : 250




Rs : 650


මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE


## 11 ශ්‍රේණි ඉංග්‍රීසි මාධ්‍ය කෙටි සටහන් පොත් ENGLISH MEDIAM SHORT NOTE BOOKS Rs 180/-




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180



Rs : 180



Rs : 180



Rs : 180

**මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.**

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE